# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,966 - 2016 මැයි මස 06 වැනි සිකුරාදා - 2016.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 834 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 839 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - ''රන්ජන් රාමනායක පදනම'' (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 මාර්තු මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මැයි මස 27 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මැයි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවය - මහර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය (මාසිකව) | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| 01 වැඩ ක්ෂේත්‍ර පරිපාලක III | 01 | රු. 13,120 - 10 x 145 - 11 x 170- 10 x 240 -10 x 320 - රු. 22,040 (MN 1-2006 A) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;<br>සහ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. |
| 02 පුස්තකාල සහායක | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130- 10 x 145 -12 x 160 - රු. 17,600 (PL 1-2006 A) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී, එක් වරකදී, කවර හෝ විෂයන් 06ක් සමත් විය යුතු වේ. |
| 03 ආයුර්වේද ඖෂධ සංයෝජක | 01 | රු. 12,210 - 10 x 130 - 10 x 145- 10 x 160 -12 x 170 - රු. 18,600 (PL 2-2006 A) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී, දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයයන් 5ක් එකවර සමත්ව තිබිය යුතුය.) රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය විසින් පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක ක්ෂේත්‍රයට අදළ සේවා පළපුරුද්ද ලබා තිබීම. |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

(iii) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බලනොපානු ඇත.) වැඩ ක්ෂේත්‍ර පරිපාලක තනතුර සඳහා පමණක් උපරිම වයස් සීමාව 18-30 අතර විය යුතුය.

(iv) අයදුම්කරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබුවකු හෝ රජයේ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබුවකු නොවිය යුතු ය.

(vi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස්කම් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මහර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) පත්වීමේ දින සිට අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

(iii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද, බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මහර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය:*

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.

2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු ය :-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
4. මෑතකදී ලබාගත් ග්‍රාමසේවා සහතිකය ;
5. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (02)ක්;
6. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික;
7. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා 2016.05.25 වැනි දිනට පෙර "ලේකම්, මහර ප්‍රාදේශීය සභාව, පහළකරගහමුණ, කඩවත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය) නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ඒ. කේ. එන්. ඉන්ද්‍රජිත්,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මහර ප්‍රාදේශීය සභාව.

2016 ක් වූ අප්‍රේල් මස 19 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහළ කරගහමුණ,
කඩවත.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***මහර ප්‍රාදේශීය සභාව***

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ .................................... තනතුර සඳහා බඳවා ගැනීම*

01. මුලකුරු සමග නම :——————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

03. ස්ථිර ලිපිනය :——————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

05. උපන් දිනය:——————.

2016.05.25 වැනි දිනට වයස : අවුරුදු :—————— මාස:—————— දින :——————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද/ලියාපදිංචි වීමෙන්ද? :——————.

08. (i) අධ්‍යාපන සුදුසුකම් :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

(ii) වෙනත් සුදුසුකම් : ——————.

09. වෘත්තියමය සුදුසුකම් : ——————.

10. සේවා පළපුරුද්ද :
(i) දැනට දරන තනතුර : ——————.
(ii) එම තනතුරට පත් වූ දිනය: ——————.
(iii) එම තනතුරේ සේවා කාලය: ——————.
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු: ——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව මා තෝරා ගැනීමට පෙර හෝ පසුව හෙළිවුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

__________,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ...............................මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම කාර්යාලයේ ...............................වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

___________,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය: ——————.

05-56

---

**කැස්බෑව නගර සභාව**

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

කැස්බෑව නගර සභාවේ පුරප්පාඩු වී පවතින වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 04 | රු. 24,250 -10 x 250 - 10 x 270-10 x 300 - 12 x 330 = රු. 36,410 (රා.ප.ච. 3/2016 වැටුප් පරිවර්තන වගුව අනුව PL1- 2016 වැටුප් පරිමාණයේ 1 පියවර වන රු. 14,234 ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (111 ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | *අධ්‍යාපන සුදුසුකම් :* අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වැනි වසර සමත්වී තිබිය යුතුය. *කායික සුදුසුකම් :* තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. |

*තනතුරට බඳවා ගැනීමේ ක්‍රමය :*
සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

02. *බඳවාගැනීම සඳහා වූ පොදු කොන්දේසි :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
(ii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.
(iv) තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට සපුරා තිබිය යුතුය.
(v) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය.
(vi) කැස්බෑව නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(vii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
(viii) කැස්බෑව නගර සභාවේ දැනට ව්‍යාපෘති පදනම මත සේවයේ යෙදෙන සේවකයින් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ.
(ix) මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මසක් ඇතුළත නියමිත සුදුසුකම් ලත් රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

*03. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
(ii) පත්වීම් දින සිට වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත්වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝග වලට ද, බස්නාහිර පළාත් සභාව හෝ පළාත් පාලන කොමසාරිස් හා කැස්බෑව නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලට අනුකූලවම කටයුතු කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතුය.
(iv) මෙම බඳවාගැනීමේ නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද කැස්බෑව නගර සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණයවේ.

04. අයදුම්කළ යුතු ආකාරය :

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි ඒ4 ප්‍රමාණයේ කඩදාසි වල අයදුම්පත් සකස් කර ඉල්ලුම්කරන තනතුර අදළ කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි සඳහන් කර 2016.05.27 දිනට පෙර ලේකම්, කැස්බෑව නගර සභාව, පිළියන්දල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

නියමිත දින පසුවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි වල, සහතිකවල පිටපත් එවිය යුතුවේ. සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. අදළ කාලසීමාව සඳහා පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය
4. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්
5. වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

06. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී, බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදළ නව බඳවාගැනීමේ පරිපාටි, ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය කැස්බෑව නගර සභාවේ ලේකම් සතුය.

කේ. ටී. ගම්ලත්,
ලේකම් *(වැ.බ.)*,
කැස්බෑව නගර සභාව.

2016 අප්‍රේල් මස 25 වැනි දින,
කැස්බෑව නගර සභාව, පිළියන්දල.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***කැස්බෑව නගර සභාව***

***වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය***

01. *(අ)* මුලකුරු සමග නම :———.

*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම්:———.

02. *(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———.

*(ආ)* ස්ථිර පදිංචි ලිපිනය:———.

03. දුරකථන අංකය : පෞද්ගලික :———. නිවස :———.

04. ස්ත්‍රී/පුරුෂ භාවය:———.

05. (අ) උපන් දිනය : වර්ෂය :———. මාසය:———. දිනය:———.

(ආ) අයදුම්පත් භාරගන්නා දිනට වයස : අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

06. හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐

07. විවාහක/අවිවාහක බව:———.

08. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද/ලියාපදිංචිමෙන් ද? යන වග :———.

09. අධ්‍යාපන සුදුසුකම් :———.

10. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කර තිබේ ද ?:———. එසේ නම් විස්තර :———.

11. වෘත්තිමය සුදුසුකම් හා පළපුරුද්ද :———.

12. ඔබ දැනට නගර සභාවේ සේවය කරන්නේ නම් :

1. දැනට දරන තනතුර :———.

2. එම තනතුරට පත්වූ දිනය :———.

3. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/දෛනික/තාවකාලික/ව්‍යාපෘති පදනම ද යන වග) :———.

13. වෙනත් සුදුසුකම් :———.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

———.

අයදුම්කරුගේ අත්සන.

දිනය:———.

05-177

# පළාත් පාලන නිවේදන

## වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු, 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දකුණු පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1834 හා 2013.10.25 දිනැති *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ නිවේදනය කරනු ලැබූ දකුණු පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා සහ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත්, අතුරු ව්‍යවස්ථා, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමටත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවන දින සිට අදාළ විධිවිධාන වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත් 2016.04.04 දින තීරණ අංක 768 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

පී. ඩබ්. ආර්. චන්දිමාලි පෙරේරා,
ලේකම්,
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව.

2016 අප්‍රේල් 04 වැනි දින,
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා කාර්යාලය,
අගලිය.

05-77

---

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

### වැරදි නිවැරදි කිරීම

1989 අංක 12 දරන (ආනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2015.04.17 දිනැති අංක 1911 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IVආ කොටසෙහි සභාව සතු මාර්ග ලෙස ප්‍රකාශයට පත් කරන ලද මාර්ගවල විරෝධතා කැඳවා පළමුවර ප්‍රකාශයට පත් කරන ලද දිනය 2014.10.24 ලෙස වැරදීමකින් සඳහන්ව ඇත. එම දිනය 2014.12.12 ලෙස නිවැරදි විය යුතු බවත්,

2015.08.07 දිනැති අංක 1927 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IVආ කොටසෙහි සභාව සතු මාර්ග ලෙස ප්‍රකාශයට පත් කන ලද මාර්ගවල විරෝධතා කැඳවා පළමුවර ප්‍රකාශයට පත් කරන ලද දිනය 2014.04.24 ලෙස වැරදීමකින් සඳහන්ව ඇත. එම දිනය 2015.04.24 ලෙස නිවැරදි විය යුතු බවත්,

ඉහත සඳහන් කරන ලද *ගැසට් පත්‍රවලට* නිවැරදි කිරීමේ සංශෝධන ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

05-152

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ජේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ජේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ජේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ජේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ජේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ජේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ජේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ජේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| මැයි | 2016.05.06 | සිකුරාදා | 2016.04.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.05.13 | සිකුරාදා | 2016.04.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.05.20 | සිකුරාදා | 2016.05.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.05.27 | සිකුරාදා | 2016.05.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2016.06.03 | සිකුරාදා | 2016.05.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.10 | සිකුරාදා | 2016.05.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.17 | සිකුරාදා | 2016.06.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.24 | සිකුරාදා | 2016.06.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2016.07.01 | සිකුරාදා | 2016.06.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.08 | සිකුරාදා | 2016.06.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.15 | සිකුරාදා | 2016.07.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.22 | සිකුරාදා | 2016.07.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.29 | සිකුරාදා | 2016.07.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.